## දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2018

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණයක් පහතින් දක්වා ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ඍජුවම අධිකාරිය වෙත ලැබී තිබුණු රු.27,982,925 ක විදේශ ප්‍රදාන හා ඉන් සිදුකරනු ලබන වියදම්, අධිකාරියේ අනෙකුත් මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරන මුදල් පොතේ සටහන් නොකර විදේශ ප්‍රදාන වෙනුවෙන් පවත්වාගෙන යන මුදල් පොතක පමණක් සටහන් කර තිබුණු අතර ලෙජර ගිණුම්වලට පිටපත් කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල හෙළදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගිණුම් පොත්පත් හා වවුචර් 2019 මාර්තු 27 දින විගණනයට ලබා දී ඇති බව | සියළුම විදේශ ප්‍රදාන හා ඉන් සිදුකරනු ලබන වියදම්, අධිකාරියේ අනෙකුත් මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරන මුදල් පොතේ සටහන් කර ලෙජර් ගිණුම්වලට පිටපත් කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.<br><br>මුදල් රෙගුලාසි ප්‍රකාරව, විදේශ ප්‍රදාන භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතු අතර වියදම් කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතුය. |

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 625(3) ප්‍රකාරව, මෙම විදේශ ප්‍රදාන භාණ්ඩාගාරයේ තැන්පත් කර නොතිබුණු අතර එම ප්‍රදාන ප්‍රයෝජනයට ගැනීම සඳහා ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා ගෙනද නොතිබුණි.<br><br>ලැබුණු ප්‍රදාන හා එමගින් සිදුකළ වියදම් සටහන් කර තිබුණු මුදල් පොත හා ගෙවීම් වවුචර් හැර ගනුදෙනු සන්නිරීක්ෂණය සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | | ගනුදෙනු සන්නිරීක්ෂණය සඳහා සියළු ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.16,416,251 ක් 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අරමුදලට හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතම 06 කට ගලපා තිබුණි. | දැනට මෙම කරුණ පිළිබඳව සලකා බලා ඇති අතර ඉදිරියේදී ප්‍රමිතය ප්‍රකාරව ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 හි 23 හා 28 ඡේද ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකරන ගනුදෙනු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | දැනටමත් මෙම තොරතුරු ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් දැනුවත් කර ඇති අතර එම තොරතුරු ලබා ගැනීම වර්තමානයේ සිදුවෙමින් පවතී. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, අධිකාරිය විසින් සේවකයන්ගේ පාරිතෝෂික ගෙවීම වෙනුවෙන් වත්කමක් ඇති කිරීමට, ආයුගණකවරයෙක් මගින් අනාගතයේදී සේවකයන්ට ගෙවීමට වන පාරිතෝෂිකවල වර්තමාන අගය ගණනය කිරීමට හා එම අගය වත්කමේ සාධාරණ අගය සමඟ සසඳා ආයුගණන ලාභ හා අලාභ ඇත්නම් එම ප්‍රමාණය ගිණුම්වල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | පාරිතෝෂික සඳහා වෙන් කිරීමක් කර ඇති අතර, ආයුගණකවරයෙක් මගින් අනාගතයේදී සේවකයන්ට ගෙවීමට සිදුවන පාරිතෝෂිකවල වර්තමාන අගය ගණනය කර අවශ්‍ය විධිවිධානයන් යෙදීමට පියවර ගනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 21 ඡේදය ප්‍රකාරව, වත්කම් පාලනය කිරීමේ හා අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ බලය අධිකාරිය සතු වන අවස්ථාවලදී පමණක් අස්පෘශ්‍ය වත්කම් හඳුනාගත යුතු වුවද, ඊට පටහැනිව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා 2016, 2017 හා 2018 වර්ෂවලදී වැය කර තිබුණු රු.67,949,653 ක් අයහාර වියදම් ලෙස හඳුනාගැනීම වෙනුවට අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන තිබුණි. | පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් ආදී ලෙස අධිකාරියේ සියළුම ක්‍රියාකාරකම් සැලකීමේදී වියදම දරන අවස්ථාවේදීම ආර්ථික ප්‍රතිලාභ ලැබීම සිදුවන බැවින් එය අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනුණි. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර මෙවැනි වියදම් අයහාර වියදම් ලෙස සලකා ගිණුම්ගත කළ යුතුය. 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.710,408 ක් වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණ අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවා තිබුණු රු.715,831 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනා ගෙන තිබුණි. | ඉදිරියේදී පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයන්හි, ඔබගේ දැනුවත් කිරීම් හා උපදෙස් අනුව ක්‍රියාකිරීමට බලාපොරොත්තු වෙමු. | උපචිත සංකල්පය අනුව වර්ෂයට අදාළ ආදායම් හා වියදම් පමණක් හඳුනා ගත යුතුය. 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.1,843,385 ක ධාරණ අගයකින් යුත් ශ්‍රව්‍ය හා දෘෂ්‍ය වීඩියෝ පට අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගත යුතු වුවත්, ඒ වෙනුවට දේපල, පිරියත හා උපකරණ යටතේ හඳුනා ගෙන තිබුණි. | ඉදිරි වර්ෂයන්හි දී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වර්ෂයේ දින ගණන 365 ලෙස යොදා ගනිමින් ක්ෂය ගණනය කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම් නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |

**1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික පනතේ 14 වගන්තියේ දක්වා ඇති කර්තව්‍යවලට අනුකූල නොවූ ක්‍රියාකාරකමක් වූ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා වෙත උපහාර පිරිනැමීමේ උත්සවයක් වෙනුවෙන් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.1,000,000 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබුණි. | මෙම වියදම ‘වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ‘දුම්කොල හා මද්‍යසාර නිවාරණය සඳහා දේශපාලන නායකයින් බලගැන්වීමේ ක්‍රියාකාරකම්’ යන අනු ක්‍රියාකාරකම යටතේ දරා ඇත. දුම්කොල හා මධ්‍යසාර පිළිබද ප්‍රතිපත්ති සකස් කරනු ලබන රජයේ උසස් නිලධාරීන්, දේශපාලන නායකයින් සහ මහජනතාව රැස්ව සිටි රැස්වීමට දුම්කොල හා මධ්‍යසාර පිළිබද ජාතික අධිකාරිය කරන ලද සහ කළ යුතු වැඩ කොටස පිළිබදව දැනුවත් කිරීම, ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ඉදිරිපිටදී සිදු කරන ලදී. එමෙන්ම අධිකාරියේ හිටපු සභාපති, මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා විසින් දුම්කොල හා මධ්‍යසාර පිළිබද ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරීත්වයට අදාළව දේශනයක්ද පැවැත්විණි. | අධිකාරියේ කර්තව්‍යවලට අනුකූල නොවූ ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම සඳහා බලය දුන්, වියදම අනුමත කළ, වියදම සහතික කළ හා ගෙවීම් කළ වගකිව යුතු නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගත යුතුය. |

## 1.6 නීති රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | | රු. | | |
| (අ) | 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික පනත | | | |
| | (i) 3(1)(ආ) වගන්තිය | අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුට ඉහළ තනතුරක් දරන අයෙක් පත්කළ යුතු වුවද, 2019 මාර්තු 31 දින වන විටත් එම සාමාජිකයා පත්කර නොතිබුණි. | මෙම සාමාජිකයා පත්කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, නැවතත් සිහි කැඳවීම් ලිපියක් යොමු කිරීමට කටයුතු යොදනු ඇත. | පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (ii) 22(2) වගන්තිය | අධිකාරිය වෙත ඒකාබද්ධ අරමුදලින්, ශ්‍රී ලංකාව තුළින් හා ඉන් පිටතින් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළු මුදල් අධිකාරිය නමින් වූ අරමුදලට බැර කරනු ලැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.47,037,360 ක් අරමුදල් ගිණුමට බැර නොකර ඒ වෙනුවට රජයේ ප්‍රදාන ගිණුමට සෘජුවම බැරකර තිබුණි. | අධිකාරිය පෙර වර්ෂවල සිට ගිණුම් ගත කිරීමේදී අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය අනුව සිදු කර ඇති අතර, ඉදිරියේදී අධිකාරියේ අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු යොදනු ඇත. | පනතට අනුකූලව කටයුතු කරමින් සියළු ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග අධිකාරිය නමින් වූ අරමුදලට බැර කළ යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ අධිකාරියේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් සකස් කරමින් පවතින බවත්, හැකි ඉක්මනින් එය ලබා දීමටත් අවශ්‍ය කටයුතු යොදනු ඇත. | චක්‍රලේඛය අනුව වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට, යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සිටින කාර්යය මණ්ඩල පිළිබඳ විස්තර, අයවැය ලේඛනය, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට, අයවැය ලේඛනය සහ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,581 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,478,615 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,467,034ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රු.12,902,799 ක් වූ ක්‍රමක්ෂය ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.